# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ආර්ථික සේවා ගාස්තු (සංශෝධන)

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2018 අගෝස්තු මස 07 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 ජුනි මස 29 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[261 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*නීතිය බලපෑමේ ප්‍රකාශය*

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ වාහන තොග ආනයන මත සේවා ගාස්තු අය කිරීමේ පදනම නිශ්චිතව සඳහන් කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල්වල තොග සහ සිල්ලර අලෙවිය මත සේවා ගාස්තු අය කිරීම වේ.

එල්.ඩී.—ඕ. 9/2018.

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2018 අංක    දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

2006 අංක 13 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපවගන්තියේ (අ) වන ඡේදයේ "අදාළ පිරිවැටුමේ සෑම කොටසක් සම්බන්ධයෙන් ම; සහ" යන වචන වෙනුවට "අදාළ පිරිවැටුමේ සෑම කොටසක් සම්බන්ධයෙන් ම;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම උපවගන්තියේ (ආ) වන ඡේදයේ —

(අ) (ii) වන උපඡේදයේ "ලෝහ තොග ආනයනය කිරීම සම්බන්ධයෙන් ; හෝ " යන වචන වෙනුවට "ලෝහ තොග ආනයනය කිරීම සම්බන්ධයෙන් ;" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) (iii) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත උපඡේදය ආදේශ කිරීමෙන්:—

"(iii) 2017 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව නමුත් මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙර මෝටර් වාහන තොග ආනයනය කිරීම සම්බන්ධයෙන් ; හෝ " ;

(3) (iii) වන උපඡේදයට ඉක්බිතිව ම පහත අලුත් උපඡේදය එකතු කිරීමෙන් —

"(iv) මේ පනත ක්‍රියාත්මක වන දින හෝ ඉන් පසුව 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ පනවන ලද නිෂ්පාදන බද්දට යටත්

නොවන සෑම මෝටර් වාහන තොග ආනයනය කිරීමක් සම්බන්ධයෙන් ; සහ

(4) (ආ) වන ඡේදයට ඉක්බිතිව ම පහත අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඇ) මේ පනත ක්‍රියාත්මක වන දින හෝ ඉන් පසුව, නිෂ්පාදන බද්දට යටත් වන සෑම මෝටර් වාහන තොග ආනයනය කිරීමක් සම්බන්ධයෙන් 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ පනවන ලද නිෂ්පාදන බදු ප්‍රමාණය මත,";

ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන උපලේඛනය සංශෝධනය කිරීම.

**3.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන උපලේඛනය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම උපලේඛනයේ 1 වන අයිතමයේ "පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් සිල්ලර වෙළෙඳාමේ යෙදී සිටින" යන වචන වෙනුවට "පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් තොග වෙළෙඳාමේ හෝ සිල්ලර වෙළෙඳාමේ යෙදී සිටින" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම උපලේඛනයේ 2 වන අයිතමයේ "පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් සිල්ලර වෙළෙඳාමේ නියැලී සිටින" යන වචන වෙනුවට "පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් තොග වෙළෙඳාමේ හෝ සිල්ලර වෙළෙඳාමේ යෙදී සිටින" යන වචන ආදේශ කිරීමෙන්.

(2) මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට සිදු කරන ලද සංශෝධන 2017 අප්‍රේල් 1 වන දින සිට බලාත්මක වන බවට සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.